**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල**

---

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

#### 1.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අරමුදලේ පොත් සමඟ සැසඳීමේදී පළාත් පාලන ආයතන 220 කින් ලැබිය යුතු ශේෂ රු.80,406,574 කින් වැඩියෙන් ද පළාත් පාලන ආයතන 72 කින් ලැබිය යතු ශේෂ රු.87,718,689 කින් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකර නොතිබුණි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිඝනක දත්ත පද්ධතියේ වියදම් වර්ගීකරණයට අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ථ විශාම වැටුප් වියදම රු.689,425,595 ක් වී තිබුණි.

#### 1.2.2 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

සමාලෝචිත වර්ෂයට අදාල ආයතන දායක මුදල් ලැබීම් මුදල් පොත අනුව ශේෂය රු.62,767,930 ක් වුව ද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති දායක මුදල් ලැබීම් උපලේඛනය අනුව එය රු.62,781,075 ක් වූයෙන් වෙනස රු.13,145 ක් විය.

#### 1.2.3 <u>අවිනිශ්චිත ගිණුම්</u>

දායක මුදල් ගැලපුම් ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට රු.3,145,484 ක නිරවුල් නොවූ ශේෂයක් විය.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1998 සහ ඉකුත් වර්ෂ වලට අදාල රු.793,241 ක අගරු වූ චෙක්පත් වෙනුවෙන් මුදල් ලබාගැනීමට හෝ ඒවා නිරවුල් කරවා ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ආයතන දායක මුදල | 1,542,364,020 | (i) | කාල ක්‍රමානුගත උපලේඛන |
| | | | (ii) | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආයතන දායක ලැබීම් | 62,767,930 | (i) | කාල ක්‍රමානුගත උපලේඛන |
| | | | (ii) | දායක මුදල් නිවේදන |

### 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති , රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) රජයේ මුදල් රෙගුලාසි 143 (3) (ආ) | තැන්පත් කළ එහෙත් 2011 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි නොවූ තැන්පතු රු.65,138ක් පැවති අතර ඒවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| i. 4.1(අ) ඡේදය | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමතකර |

| | |
|---|---|
| | නොතිබුණි |
| ii. 4.3(ඇ) ජේදය | සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 2(IV) ජේදය | අරමුදලේ මාසික වියදම් පිළිබඳ ඒකාබද්ධ වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙන්වාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.54,478,480 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.56,901,123 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,422,643ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආයතන දායක මුදල රු.122,978,480 ක් වන අතර ඊට අදාලව ලැබී තිබුණු රු.62,781,075 ක් අරමුදලේ විශ්‍රාම වැටුප් ගෙවීම වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කළ දායක මුදලින් අරමුදලට නොලැබුණු ප්‍රමාණය වූ රු.60,197,405 ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් ගෙවා තිබුණි. එය වියදමක් ලෙස නිසිපරිදි ගිණුම් නොතැබීම සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ රු.54,478,480 ක්වූ අතිරික්තය නිරූපනය වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 18 වගන්තිය ප්‍රකාරව උක්ත අරමුදලේ පාලනය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බව සඳහන්ව ඇතත් පනතේ නියෝගයන්ට පටහැනිව 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් අරමුදලේ මාසික වැටුප් ලේඛන පිළියෙල කිරීම හා ලිපි ගොනු භාරකාරත්වය 2011 ජනවාරි 01 දින සිට ප්‍රාදේශීය ලේකම්වරුන්වෙත විමධ්‍යගත කර තිබුණි.

## 3.2 දායක මුදල් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු හිඟ ආයතන දායක මුදල රු.1,542,364,020 ක් වු අතර එයින් පිළිවෙලින් 56.02% ක්, 15.14% ක් හා 28.84 % ක් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශිය සභාවලින් අයවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ නගර සභා වලට අදාල දායක මුදල රු.15,511,996 ක් වූ අතර පෙර වර්ෂයේ හිඟ මුදල් ද සමඟ රු.18,933,532 ක් ලැබී තිබුණි. මහ නගර සභා හා ප්‍රාදේශීය සභා වල සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු ආයතන දායක මුදල හා හිඟ මුදල විශ්ලේෂණය කර පහත දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | සමාලෝචිත වර්ෂයට අදාල දායක මුදල | සමාලෝචිත වර්ෂයේ ලැබුණු දායක මුදල | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු හිඟ දායක මුදල | හිඟ දායක මුදල වර්ෂයේ දායක මුදලේ % ක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| මහ නගර සභා | 82,575,769 | 27,552,734 | 55,023,035 | 66.6 |
| ප්‍රාදේශිය සභා | 24,890,715 | 16,294,809 | 8,595,906 | 34.53 |
| **එකතුව** | **107,466,484** | **43,847,543** | **63,618,941** | |

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී ආයතන දායක මුදල් කිසිවක් ගෙවා නොමැති ප්‍රාදේශීය සභා සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව පහත දක්වා ඇත. සමාලෝචිත වර්ෂය සඳහා එම ආයතනයන්ගෙන් ලැබිය යුතු ආයතන දායක මුදල රු. 15,802,249 ක් විය.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | සමාලෝචිත වර්ෂයේ ආයතන දායක මුදල් කිසිවක් නොගෙවූ ආයතන සංඛ්‍යාව | නොගෙවූ ආයතන සංඛ්‍යාව මුළු ආයතන වල % ලෙස |
|---|---|---|---|
| කුරුණෑගල | 17 | 17 | 100 |
| පොළොන්නරුව | 06 | 02 | 33 |

| | | | |
|---|---|---|---|
| පුත්තලම | 09 | 09 | 100 |
| බදුල්ල | 14 | 07 | 50 |
| අනුරාධපුර | 18 | 17 | 94 |
| මන්නාරම | 04 | 03 | 75 |
| රත්නපුර | 13 | 06 | 46 |
| කෑගල්ල | 10 | 02 | 20 |
| මොණරාගල | 10 | 05 | 50 |
| අම්පාර | 13 | 10 | 77 |
| ත්‍රිකුණාමලය | 09 | 08 | 89 |
| වවුනියාව | 04 | 01 | 25 |
| නුවරඑළිය | 05 | 04 | 80 |
| මහනුවර | 17 | 10 | 59 |
| යාපනය | 12 | 06 | 50 |
| මඩකලපුව | 10 | 09 | 90 |
| මාතලේ | 10 | 07 | 70 |
| හම්බන්තොට | 09 | 06 | 67 |
| මුලතිව් | 03 | 03 | 100 |
| කළුතර | 10 | 03 | 30 |
| මාතර | 12 | 10 | 83 |
| කිලිනොච්චිය | 03 | 01 | 33 |
| ගාල්ල | 15 | 15 | 100 |
| | ----- | ------- | |
| | 233 | 161 | |
| | ==== | ==== | |

ඉහත නිරීක්ෂණය අනුව දායක මුදල් රැස්කර ගැනීම සම්බන්ධයෙන් අරමුදල ප්‍රමාණවත් කාර්යක්ෂමතාවයක් දක්වා නොතිබුණි.

4. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) ලැබිය යුතු හිඟ දායක මුදල් .